ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020
පාසල් පාදක තක්සේරුකරණය යටතේ (44) නර්තනය (දේශීය) විෂයට අදාළ 11 ශ්‍රේණියේ
අවසාන තක්සේරුකරණය

2020 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත 11 ශ්‍රේණියේ නර්තනය (දේශීය) විෂයයට අදාළ දෙවන පාසල් පාදක තක්සේරුකරණය පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

මෙම පරීක්ෂණයට අ.පො.ස.(සා.පෙළ) අපේක්ෂකයෙකුගේ නර්තනය, ගායනය හා වාදන කුසලතා මැන බැලීම සඳහා සිදු කෙරෙන පස්වන (අවසාන) තක්සේරු අවස්ථාව වේ.

- මෙම පරීක්ෂණය ක්‍රියාකාරකම් පහකින් සමන්විත ය.

| ක්‍රියාකාරකම් අංකය | ක්‍රියාකාරකම | කාලය විනාඩි | නිර්ණායක සංඛ්‍යාව | ලකුණු |
|---|---|---|---|---|
| 1 | ගායනය හා වාදනය | 6 | 4 | 20 |
| 2 | සරඹ නර්තනය | 3 | 4 | 20 |
| 3 | වන්නම් නර්තනය | 5 | 4 | 20 |
| 4 | ගැමි නර්තනය | 3 | 4 | 20 |
| 5 | නර්තන නිර්මාණය | 3 | 4 | 20 |
| | | 20 | 20 | 100 |

- ඉහත සියලු ම ක්‍රියාකාරකම් කේවල වශයෙන් තක්සේරු කෙරේ.
- මෙම පරීක්ෂණය සඳහා ඉදිරිපත්වීමේ දී පුහුණු ඇඳුම් කට්ටලයක් භාවිතා කළ යුතු වේ.
- පරීක්ෂණය සඳහා සුදුසු වාතාරණයක් සහිත පන්ති කාමරයක් යොදා ගැනීම, පාසලේ විදුහල්පති සහ විෂයභාර ගුරුවරයාගේ වගකීමකි.
- පරීක්ෂණය පැවැත්වෙන කාලය තුළ පරීක්ෂණයට උචිත පරිසරයක් පවත්වා ගැනීමට ද විදුහල්පති වගබලා ගත යුතු ය.
- අයදුම්කරුවන් ඉදිරිපත්වන සම්ප්‍රදායට අයත් බෙර, තාලම්පට සහ ගැමි නර්තන මෙවලම් (ආදේශ භාණ්ඩ) අදාළ පාසලේ විෂයභාර ගුරුවරයා විසින් සපයා ගත යුතු ය.
- ලබා දී ඇති ක්‍රියාකාරකම් අතුරින් එක් එක් ශිෂ්‍යයා සඳහා ක්‍රියාකාරකම් තෝරා ගැනීම අහඹු ලෙස ශිෂ්‍යයා විසින් ම සිදු කරනු ලැබෙන අතර කුසපත් ඇදීම මේ සඳහා භාවිතා කළ හැක.

**ලකුණු ලබා දීම**

- නිර්ණායකයට අදාළ ව ලකුණු ප්‍රදානයේ දී උපරිම සාධන මට්ටමේ සිට අවම සාධන මට්ටම දක්වා වන පොදු ප්‍රමිතීන් පහත දැක්වේ.
- පරීක්ෂක මණ්ඩලයේ තිදෙනාගේ ම එකඟතාව මත ලකුණු තීරණය කළ යුතු ය.

| ලකුණ | ප්‍රමිතිය | විස්තරය |
|---|---|---|
| 5 | විශිෂ්ට යි | ගුණාත්මක බවින් යුත් ඉතා විශිෂ්ට මට්ටටමේ ඉදිරිපත් කිරීමකි. |
| 4 | ඉතා හොඳ යි | ගුණාත්මක බවින් ඉහළ ඉදිරිපත් කිරීමකි. අවශ්‍ය වන්නේ යම් යම් සංවර්ධනයන් කිහිපයක් පමණි. |
| 3 | හොඳ යි | මූලික ශිල්පීය අවශ්‍යතාවන් හා ප්‍රමිතීන් සපුරා ඇත. තව දුරටත් සංවර්ධනය කළ හැකි ශිල්පීය හා නිර්මාණාත්මක විභවයන් විශද කරවයි. |
| 2 | සංවර්ධනය කළ යුතු යි | අපේක්ෂිත නිපුණතා මට්ටමට ළඟා වී නැත. පුහුණුව හා සූදානම ප්‍රමාණවත් නැත. මූලික මට්ටමමේ ඉදිරිපත් කිරීමකි. ගුණාත්මක ව පෝෂණය වී නැති හෙයින් ඇගැයීම් මණ්ඩලයේ සහයෝගය මත ඉදිරිපත් කිරීම් සිදු කරයි. |
| 1 | වඩාත් සංවර්ධනය කළ යුතු යි | දරුවාගේ සූදානම ඉතා අවම ය. ඇගයීම පිළිබඳ අවබෝධයක් නැත. ඇගැයීම් මණ්ඩලයේ ද සහයෙන් යම් ඉදිරිපත් කිරීමට උත්සහ ඉදිරිපත් කිරීම අසාර්ථකයි. |

**පරීක්ෂක මණ්ඩලය**

- පරීක්ෂක මණ්ඩලයක සාමාජිකයන් 3කි.

  ප්‍රධාන පරීක්ෂක - අදාළ කලාපයේ නර්තනය (දේශීය) විෂය සම්බන්ධව අත්දැකීම් සහිත විෂය අධ්‍යක්ෂකවරයෙක්/ ගුරු උපදේශකවරයෙක්/ 10 - 11 ශ්‍රේණිවල නර්තනය (දේශීය) විෂය ඉගැන්වීමෙහි නිරතවන අත්දැකීම් සහිත ගුරුවරයෙක්

  පරීක්ෂක 01 - අදාළ කලාපයේ 10 - 11 ශ්‍රේණිවල නර්තනය (දේශීය) විෂය ඉගැන්වීමෙහි නිරතවන අත්දැකීම් සහිත ගුරුවරයෙක්

  පරීක්ෂක 02 - පරීක්ෂණය සඳහා ඉදිරිපත් වන සිසුන්ට නර්තනය (දේශීය) විෂය උගන්වන ගුරුවරයා (වාදනයෙන්ද සහය වීම අවශ්‍ය වේ.)

- තීරණය කර ගත් ලකුණු සටහන් කිරීම සඳහා පත්‍ර 3කි.

**1 විස්තරාත්මක ලකුණු සටහන් පත්‍රය**

- එක් අපේක්ෂකයෙකුට එක් විස්තරාත්මක ලකුණු ලැයිස්තුව බැගින් භාවිතා කළ යුතු වේ.
- ක්‍රියාකාරකම් 05 සඳහා ඒ ඒ නිර්ණායක යටතේ ලබා ගත් ලකුණු කවයකින් සටහන් කිරීම අවශ්‍ය වේ.
- එම නිර්ණායක හතර සඳහා ලබා ගත් ලකුණුවල එකතුව දකුණු පස ඇති කොටුව තුළ සඳහන් කළ යුතු ය.
- ක්‍රියාකාරකම් 05 සඳහා ලබා ගත් ලකුණුවල එකතුව 100න් ලකුණක් ලෙස සටහන්කර නිවැරදි බවට පරීක්ෂක මණ්ඩලයේ සියලු දෙනා තහවුරු කළ යුතු ය.

**2 සංක්ෂිප්ත ලකුණු සටහන් පත්‍රය**

- දෛනිකව එක් සංක්ෂිප්ත ලකුණු ලැයිස්තුවක් භාවිතා කළ යුතු ය.
- එක් එක් අපේක්ෂකයා ක්‍රියාකාරකම් 05 සඳහා ලබා ගත් ලකුණු වෙන වෙන ම ඇතුළත් කර මුළු ලකුණු ද ඇතුළත් කළ යුතු ය.
- පරීක්ෂක මණ්ඩලයේ සියලු ම දෙනා ලකුණුවල නිරවද්‍යතාව තහවුරු කළ යුතු වේ.

**3 පරිගණක මුද්‍රිත අවසන් ලකුණු ලැයිස්තුව**

- සංක්ෂිප්ත ලකුණු ලැයිස්තුවට අනුව අපේක්ෂකයා ක්‍රියාකාරකම් 05 සඳහා ලබාගත් මුළු ලකුණු ඉලක්කමෙන් සහ අකුරෙන් ඇතුළත් කළ යුතු ය.

- පරීක්ෂක මණ්ඩලයේ සියලු දෙනා ඉහත ලකුණු ලැයිස්තු තුනෙහි ලකුණු සංසන්දනය කර බලා නිවැරදි බව තහවුරු කර ගැනීම අවශ්‍ය වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020

පාසල් පාදක තක්සේරුකරණය යටතේ (44) - නර්තනය (දේශීය) විෂයට අදාළ 11 ශ්‍රේණියේ

අවසාන තක්සේරුකරණය

<table>
<tr>
<td>ක්‍රියාකාරකම<br>01<br><br>ගායන හා වාදන</td>
<td>(අ) ගායන<br>i. කැමති ගායනයක්<br>ii. පහත සඳහන් කාණ්ඩ අතුරෙන් කුසපත් ඇදීමෙන් එක් කාණ්ඩයක් තෝරා ගැනීමට අපේක්ෂකයාට අවස්ථාව දෙනු ලැබේ. එම කාණ්ඩයෙන් ඔබ කැමති එක් කවියක් ගායනය කිරීම.<br><br>
<table>
<tr><td>A</td><td>මල්යහන්/ ප්‍රශස්ති/ ගොයම්/කළගෙඩි</td></tr>
<tr><td>B</td><td>ග්‍රහපංති/ පන්තේරු/සොකරි/ කුළු</td></tr>
<tr><td>C</td><td>කඩතුරා/ චාමර/ ලී කෙළි/ රබන්</td></tr>
<tr><td>D</td><td>සිරසපාද/හටන්/කළගෙඩි/ ලී කෙළි</td></tr>
</table>
<br>(ආ) වාදන<br>(i) කැමති බෙර සරඹයක් තාල තබා කීම සහ මධ්‍ය ලයට වාදනය කිරීම<br>(ii) කැමති බෙර පදයක් තාල ලබා කීම සහ මධ්‍ය ලයට වාදනය කිරීම<br><br>තක්සේරු කිරීමේ නිර්ණායක<br>(අ) i කැමති ගායනයේ කුසලතා ප්‍රදර්ශනය (ලකුණු 5)<br>ii නම්කරන ලද ගායනයේ කුසලතා ප්‍රදර්ශනය (ලකුණු 5)<br>(ආ) i බෙර සරඹය වාදන කුසලතාව (ලකුණු 5)<br>ii බෙර පදය වාදන කුසලතාව (ලකුණු 5)</td>
<td>මුළු ලකුණු<br><br>20</td>
</tr>
<tr>
<td>ක්‍රියාකාරකම<br>02<br><br>සරඹ නර්තනය</td>
<td>6-12 දක්වා සරඹ අතුරෙන් කුසපත් ඇදීමෙන් එක් සරඹයක් තෝරා ගැනීමට අපේක්ෂකයාට අවස්ථාව දෙනු ලැබේ. අපේක්ෂකයා උගත් නර්තන සම්ප්‍රදායට අනුව එම සරඹය මධ්‍ය ලයට නර්තනය කිරීම<br>[ • උඩරට නර්තන සම්ප්‍රදාය - 6-12 ගොඩසරඹ, කස්තිරම් සහිතව<br>• පහතරට නර්තන සම්ප්‍රදාය - 6-12 ඉලංගම් සරඹ, ඉරට්ටි සහිතව<br>• සබරගමු නර්තන සම්ප්‍රදාය - 6-12 දෙඕන පද, හමාර පද සහිතව ]<br><br>තක්සේරු කිරීමේ නිර්ණායක<br>නිවැරදි අංගහාර හා සාම්ප්‍රදායික ලක්ෂණ භාවිතය (ලකුණු 5)<br>ශරීර චලන හැසිරවීම (ලකුණු 5)<br>තාල වාදනයට අනුකූලව නර්තනය ඉදිරිපත් කිරීම (ලකුණු 5)<br>කස්තිරම/ ඉරට්ටිය/හමාර පදය සරඹ නර්තනයට අදාළ ව ඉදිරිපත් කිරීම (ලකුණු 5)</td>
<td>20</td>
</tr>
<tr>
<td>ක්‍රියාකාරකම<br>03<br><br>වන්නම් නර්තනය</td>
<td>පහත සඳහන් කාණ්ඩ අතුරෙන් කුසපත් ඇදීමෙන් එක් කාණ්ඩයක් තෝරා ගැනීමට අපේක්ෂකයාට අවස්ථාව දෙනු ලැබේ. එම කාණ්ඩයෙන් කැමති එක් වන්නමක් සම්පූර්ණයෙන් නර්තනය කිරීම.<br><br>
<table>
<tr><td>A</td><td>මුසලඩි වන්නම/හනුමා වන්නම<br>ශුද්ධ තාලය/ හනුමන්තා තාලය<br>කොවුලා වන්නම/ අනිලා වන්නම</td></tr>
<tr><td>B</td><td>තුරඟා වන්නම/වෛරොඩි වන්නම<br>භවාදී තාලය/ ඊශ්වර කුන්ඩ තාලය<br>කුදරඩි වන්නම/ කදම්භ පක්ෂි වන්නම</td></tr>
<tr><td>C</td><td>සිංහරාජ වන්නම/ සැවුලා වන්නම<br>අනුරාගඳණ්ඩ තාලය/නාතිලිංචි තාලය<br>විරාඩි වන්නම/මණ්ඩුක වන්නම</td></tr>
</table>
<br>තක්සේරු කිරීමේ නිර්ණායක<br>ගායන කුසලතාව (ලකුණු 5)<br>පද නර්තනය (ලකුණු 5)<br>කස්තිරම, සීරුමාරුව/ කලාසම නර්තනය/ඉරට්ටිය තාල තබමින් කීම (ලකුණු 5)<br>අඩව්ව/ඉරට්ටිය නර්තනය (ලකුණු 5)</td>
<td>20</td>
</tr>
</table>

<table>
<tr>
<td>ක්‍රියාකාරකම<br>04<br><br>ගැමි නර්තනය</td>
<td>පහත සඳහන් කාණ්ඩ අතුරෙන් කුසපත් ඇදීමෙන් එක් කාණ්ඩයක් තෝරා ගැනීමට අපේක්ෂකයාට අවස්ථාව දෙනු ලැබේ. එම කාණ්ඩයෙන් කැමති එක් ගැමි නැටුමක් නර්තනය කිරීම.<br><br>
<table>
<tr><td>A</td><td>ලී/ ගොයම්/ කළගෙඩි</td></tr>
<tr><td>B</td><td>කළගෙඩි/ රබන්/ කඩු</td></tr>
<tr><td>C</td><td>කුළු/ චාමර/ ලී කෙළි</td></tr>
<tr><td>D</td><td>මෝල්ගස්/ කළගෙඩි/ ලි කෙළි</td></tr>
</table>
<br>තක්සේරුවන කිරීමේ නිර්ණායක<br><br>
ගැමිනැටුමට උචිත චලන භාවිතය (ලකුණු 5)<br>
රංග උපකරණ හැසිරවීම (ලකුණු 5)<br>
අවකාශ භාවිතය (ලකුණු 5)<br>
ඉදිරිපත් කිරීම (ලකුණු 5)</td>
<td>20</td>
</tr>
<tr>
<td>ක්‍රියාකාරකම<br>05<br><br>නර්තන නිර්මාණ</td>
<td>පහත සඳහන් කාණ්ඩ අතුරෙන් කුසපත් ඇදීමෙන් එක් කාණ්ඩයක් තෝරා ගැනීමට අපේක්ෂකයාට අවස්ථාව දෙනු ලැබේ. එම කාණ්ඩයෙන් කැමති එක් චරිතයක් තෝරා ගෙන ඊට අදාළ සිද්ධි හා අවස්ථා පෙළගස්වා නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම.<br><br>
<table>
<tr><td>A</td><td>මුවෙක්/ දඩයක්කරුවෙක්/ මහලු කාන්තාවක්</td></tr>
<tr><td>B</td><td>මොණරෙක්/රජකුමාරයෙක්/ රජකුමරියක්</td></tr>
<tr><td>C</td><td>සිංහයෙක්/ ධීවරයෙක්/සිඟන්නියක්</td></tr>
<tr><td>D</td><td>වඳුරෙක්/ ගොවියෙක්/ යක්ෂණියක්</td></tr>
</table>
<br>තක්සේරු කිරීමේ නිර්ණායක<br><br>
චරිත ස්වභාවය හඳුනාගැනීම හා භාව ප්‍රකාශනය (ලකුණු 5)<br>
අවස්ථා සිද්ධි ගොඩනැගීම (ලකුණු 5)<br>
උචිත නර්තන චලන භාවිතය (ලකුණු 5)<br>
අවකාශ භාවිතය හා ඉදිරිපත් කිරීම (ලකුණු 5)</td>
<td>20</td>
</tr>
</table>

100

ක්‍රියාකාරකම් 5 සඳහා මුළු ලකුණු

ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

ක්‍රියාකාරකම 01 (ගායන හා වාදන කුසලතා)

| ඇගයීම් නිර්ණායකය | විශිෂ්ට මට්ටම | ඉහළ මට්ටම | සම්මාන මට්ටම | ආසන්න මට්ටම | නිපුණතා මට්ටමට ලඟා නොවූ |
|---|---|---|---|---|---|
| කැමති ගායනය ඉදිරිපත් කරය. | • විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි,<br>• නිවැරදි නාදමාලාව හා හඬපාලනය විශිෂ්ට ලෙස පවත්වා ගනිමින් ගායනා කරයි.<br>• උච්චාරණය ඉතා ඉහළ ය.<br>• තාලානුකූල/රිද්මානුකූල බව විශිෂ්ට ලෙස ප්‍රදර්ශනය කරය. කවිය සම්පූර්ණයෙන්<br>• විශ්වාසයෙන් යුතුව මතකයෙන් ගායනය කරයි.<br>• විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. | • ගායනයේ නාදමාලාව හා හඬපාලනය නිවැරදිවම පවත්වා ගනියි.<br>• උච්චාරණය පැහැදිලියි.<br>• තාලානුකූලබව / රිද්මයානුකූල බව නිවැරදිව පවත්වා ගනියි.<br>• කවිය සම්පූර්ණයෙන් නිවැරදිව මතකයෙන් ගායනය කරයි. | • හඬ පාලනය කෙරෙහි අවධානය අඩු වුවද ගායනයේ නාද මාලාව නිවැරදිව පවත්වා ගනියි.<br>• තාලානුකූලව/රිදිමානුකූල නුකූල බව පවත්වා ගනියි.<br>• පද මාලාව මතකයෙන් ගයයි. | • ගායනයෙහි නාදමාලාව නිශ්චිත නොවන අවස්ථා පවතියි.<br>• නාදමාලාව හා හඬ පාලනය ස්ථාවර නොවන අයුරින් ගායනය කරයි.<br>• ගයනයේ තාලානුකූල/ රිද්මානුකූල බව තරමක් නිවැරදිය.<br>• ගායනයේදී පද මාලාව මතකයෙන් ගිලිහී යන අවස්ථා පවති. | • ගායනය ඉදිරිපත් කළ ද නාදමාලාව හා හඬ පාලනය නිවැරදි නොවේ.<br>• පද මාලාව (කවිපද) බොහෝ තැන් මතක නැත.<br>• ගායනයේ තාලානුකූල/රිද්මානුකූල බව නිවැරදි නොවේ. |
| නම්කරනලද ගායනය ඉදිරිපත් කරයි, | • විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි,<br>• නම්කරන ලද ගායනය සම්පූර්ණයෙන් මතකයෙන් ගයයි.<br>• නිවැරදි නාදමාලාව හා හඬපාලනය කරමින් ගයයි, නිවැරදි වචන භාවිතය හා උච්චාරණය ඉතා ඉහළයි. කරයි.<br>• තාලානුකූලව හෝ රිද්මානුකූලව ගායනය කරයි.<br>• නිමවුම් ගුණයෙන් යුක්තය. කවිය සම්පූර්ණයෙන්<br>• මතකයෙන් ගායනය කරය. විශිෂ්ට ශිල්පීය ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි, | • නම්කරන ලද ගායනය සම්පූර්ණයෙන් මතකයෙන් ගයයි.<br>• ගායනයේ නාදමාලාව හා හඬපාලනය<br>• නිවැරදිවම පවත්වා ගනියි.<br>• නිවැරදි වචන භාවිතය හා නිවැරදි උච්ඡාරණය සිදුකරයි.<br>• තාලානුකූලබව හෝ රිද්මයානුකූල බව නිවැරදිව පවත්වා ගනියි.<br>• කවිය සම්පූර්ණයෙන් මතකයෙන් ගායනය කළද නිමවුම් ගුණයෙන් යුක්ත නොවේ. | • නම්කරන ලද ගායනය සම්පූර්ණයෙන් මතකයෙන් ගයයි.<br>• ගායනයේ නාද මාලාව හා හඬ පාලනය බො හෝ දුරට පවත්වා ගනියි.<br>• නිවැරදි වචන භාවිත කරයි.<br>• තාලානුකූලව හෝ රිදිමානුකූලබව බොහෝ විට පවත්වා ගනියි. | • ගායනයෙහි නාදමාලාව යම් තරමකට නිවැරදිව පවත්වා ගනියි.<br>• එහෙත් නාදමාලාව හා හඬ පාලනය ස්ථාවර නැත,වරින් වර එය වෙනස් වේ.<br>• ගයනයේ තාලානුකූල බව හෝ රිද්මානුකූල බව තරමක් නිවැරදිය.<br>• පද මාලාව ඇතැම් ස්ථාන මතක නැත. | • ගායනය ඉදිරිපත්කළද වැරදි නාදමාලාව හා හඬ පාලනය සිදු කරයි.<br>• පද මාලාව බොහෝ තැන් මතක නැත.<br>• ගායනයේ තාලානුකූල බව හෝ රිද්මානුකූල බව නිවැරදි නොවේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| බෙරසරඹ වාදන කුසලතාව | • වාදනයේ විශිෂ්ට ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි.<br>• බෙර සරඹය තාල තබමින් නිවැරදි ව කියයි.<br>• බෙරපදය වාදනයේදී වම හා දකුණ නිවැරදි ව හඳුනා ගනියි.<br>• බෙර අක්ෂර උත්පාදනය නිවැරදි ව සිදුකරයි.<br>• බෙර සරඹය අඛණ්ඩව ආයාසයකින් තොරව ධ්වනි ගුණයෙන් යුක්ත ව වාදනය කරයි. | • බෙර සරඹය තාලතබමින් නිවැරදි ව කියයි.<br>• බෙරයේ වම හා දකුණ නිවැරදි ව හදුනා ගනියි.<br>• බෙර අක්ෂර හදුනාගෙන හඬ උත්පාදනය කරයි.<br>• බෙර සරඹය පැහැදිළි ව වාදනය කරයි. | • බෙර සරඹය තාල තබමින් කියයි.<br>• බෙරයේ වම හා දකුණ හඳුනා ගනියි.<br>• හඬ උත්පාදනය කෙරෙහි අවධානය අඩු වුව ද බොහෝ බෙර අක්ෂර නිවැරදි ව වාදනය කරයි.<br>• බෙර සරඹය අඛණ්ඩව වාදනය කරයි. | • බෙර සරඹය තාල තබමින් කියයි.<br>• බෙරයේ වම හා දකුණ උත්සහයකින් පසු හඳුනා ගනියි.<br>• බෙර අක්ෂර නිවැරදි ම උත්පාදනය නොවූවද බෙරපදය වාදනය කරයි.<br>• බෙර පදයේ අඛණ්ඩතාව වරින් වර බිදෙමින් වාදනය කරයි. | • බෙර සරඹය ප්‍රකාශ කළ ද තාලතැබීමට අපහසු ය.<br>• බෙරයේ වම හා දකුණ නොහඳුනයි.<br>• බෙර සරඹ වාදනය කිරීමට උත්සාහ කළ ද බෙර අක්ෂර නිවැරදි ව උත්පාදනය නොවේ.<br>• බෙර සරඹය අඛණ්ඩ ව වාදනය නොකරයි. |
| බෙර පද වාදන කුසලතාව | • වාදනයේ විශිෂ්ට ප්‍රාගුණ්‍යයක ප්‍රකට කරයි.<br>• බෙර පදය තාල තබමින් නිවැරදි කියයි.<br>• බෙරපදයෙහි වම හා දකුණ නිවැරදි ව හඳුනා ගනියි.<br>• බෙර අක්ෂර උත්පාදනය නිවැරදිව ම සිදුකරයි.<br>• බෙර සරඹය අඛණ්ඩ ව ආයාසයකින් තොරව වාදනය කරයි.<br>• ධ්වනි ගුණය හඳුනාගෙන වාදනය කරයි. | • බෙර පදය තාල තබමින් නිවැරදි ව කියයි.<br>• බෙරයේ වම හා දකුණ හඳුනා ගනියි<br>• බෙර අක්ෂර උත්පාදනය පැහැදිලියි.<br>• බෙර පදය වාදනය කරයි. | • බෙරපදය තාල තබමින් කියයි.<br>• බෙරයේ වම හා දකුණ හඳුනා ගනියි.<br>• බොහෝ බෙර අක්ෂර උත්පාදනය වෙයි.<br>• බෙර පදය බොහෝවිට අඛණ්ඩව වාදනය කරයි. | • බෙරපදය තාල තබමින් කියයි.<br>• බෙරයේ වම හා දකුණ උත්සහයකින් පසු හදුනා ගනියි.<br>• බෙර අක්ෂර උත්පාදනය නොවූව ද බෙර පදය වාදනය කරයි,<br>• බෙර පදයේ අඛණ්ඩතාව වරින්වර බිඳෙමින් වාදනය කරයි. | • බෙර පදය තාල තබමින් කීමට අපහසුයි.<br>• බෙරයේ වම හා දකුණ නොහඳුනයි.<br>• බෙර පදය වාදනය කිරීමට උත්සහ කළ ද බෙර අක්ෂර උත්පාදනය නොවෙයි.<br>• බෙර පදය අඛණ්ඩව වාදනය නොකරයි. |

## ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්
## ක්‍රියාකාරකම 02 :- සරඹය - නර්තනය

| නිර්නායකය | විශිෂ්ටයි<br>5 | ඉතා හොඳයි<br>4 | හොඳයි<br>3 | සාමාන්‍යයි<br>2 | වඩාත් සංවර්ධනය විය යුතුයි<br>1 |
|---|---|---|---|---|---|
| නිවැරදි අංගහාර හා සාම්ප්‍රදායික ලක්ෂණ භාවිතය | • නිවැරදි අංගහාරවල විශිෂ්ට ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි.<br><br>• මණ්ඩිය හා සරඹයේ පාද තැබීම පිළිබඳ අවබෝධය විශිෂ්ටයි.<br><br>• සාම්ප්‍රදායික අනන්‍යතාව ඉතා විශිෂ්ට ලෙස ප්‍රදර්ශනය කරයි.<br><br>•සරඹයේ පාද තැබීම (පද පෑගීම) නිශ්චිත ව හා විශ්වාසයෙන් යුතු ව සිදු කරයි. | • නිවැරදි අංගහාර ඉහළ මට්ටමකින් ඉදිරිපත් කරයි.<br><br>• මණ්ඩිය හා සරඹයේ පාද තැබීම පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.<br><br>• සම්ප්‍රදායික අනන්‍යතාව මතුකරමින් සාර්ථක ව සරඹය ප්‍රදර්ශනය කරයි.<br><br>• සරඹයේ පද පෑගීම හොඳින් සිදු කරයි. | • නිවැරදි අංගහාර කුසලතා ප්‍රදර්ශනය කරයි.<br><br>•මණ්ඩිය හා සරඹයේ පාද තැබීම පිළිබඳ අවබෝධයෙන් යුක්තයි. චලනය ඉදිරිපත් කරයි.<br><br>• සාම්ප්‍රදායික බව ආරක්ෂා කරමින් නර්තනය කරයි.<br><br>• පද පෑගීම සරඹයට අනුකූලව ඉදිරිපත් කරයි. | • නිවැරදි අගංහාර හඳුනා ගනිමින් නර්තනය ඉදිරිපත් කිරීමට උත්සාහ ගනියි.<br><br>• මණ්ඩිය හා සරඹයේ පාද තැබීමේ විශේෂතා නර්තනයේ දී හසුරුවා ගැනීමට අපහසුයි.<br><br>• සාම්ප්‍රදායික බව ආරක්ෂා කර ගැනීමට උත්සාහ ගනියි.<br><br>• සරඹයේ පද පෑගීම නිශ්චිත බව අඩුයි. ඉදිරිපත් කිරිමට උත්සාහ ගනියි. | • නිවැරදි අගංහාර හඳුනා ගැනීම පැහැදිලි නැත.<br><br>• මණ්ඩිය හා සරඹයේ පාද තැබීමේ අනන්‍ය විශේෂතා නොහඳුනයි.<br><br>• සාම්ප්‍රදායික බව ආරක්ෂා කර ගැනිම සිදු නොවේ.<br><br>• සරඹයේ පද පෑගීමට අපහසුයි. |
| ශරීර චලන හැසිරවීම | • ශරීර චලන හැසිරවීම පිළිබඳ සුවිශේෂ ප්‍රාගුණ්‍යයක් ප්‍රදර්ශනය කරයි.<br><br>• හස්ත හා පාද චලනය ඉතා ප්‍රශස්ත මට්ටමින් ඉදිරිපත් කරයි.<br><br>• ශරීර චලන හැසිරවීම සාම්ප්‍රදායනුකූල ව විශිෂ්ට ලෙස ප්‍රදර්ශනය කරයි.<br><br>• සරඹයට අදාළ චලන ව්‍යුහය මැනවින් අවබෝධ කොට ඉතා විශිෂ්ට ලෙස ප්‍රදර්ශනය කරයි. | • සුවිශේෂ වූ චලන කුසලතා හැසිරවීම මැනවින් ප්‍රදර්ශනය කරයි.<br><br>• හස්ත හා පාද චලන ඉහළ මට්ටමකින් ඉදිරිපත් කරයි.<br><br>• චලන හැසිරවීම සම්ප්‍රදායට අනුව අනන්‍ය ලක්ෂණ ප්‍රදර්ශනය කරමින් සාර්ථක ඉදිරිපත් කරයි.<br><br>• සරඹයට අදාළ චලන ව්‍යුහය මැනවින් ප්‍රදර්ශනය කරයි. | • නර්තනයේ දී චලන හැසිරවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br><br>• හස්ත හා පාද චලන නිවැරදි ව ඉදිරිපත් කරයි.<br><br>• චලනයේ සාම්ප්‍රදායික අනන්‍ය ලක්ෂණ හඳුනාගෙන නර්තනය ඉදිරිපත් කරයි.<br><br>• සරඹයේ චලන අඛණ්ඩව ඉදිරිපත් කරයි. | • චලන හැසිරවීම් කුසලතා ප්‍රදර්ශනයේ අඩුපාඩු පෙන්නුම් කරයි.<br><br>• හස්ත හා පාද චලන ඉදිරිපත් කිරීමේ දී නිවැරදි බව ගිලිහෙයි.<br><br>• චලනයේ සාම්ප්‍රදායික ලක්ෂණ පවත්වා ගැනීමට උත්සාහ ගනී. අඛණ්ඩව ඉදිරිපත් නොකරයි.<br><br>• සරඹයන්ට අදාළ චලන අංග ඉදිරිපත්කිරීම පිළිබඳ සැලකිල්ලක් නොදක්වයි. | • චලන හැසිරවීමේ කුසලතා පෙන්නුම් නො කරයි.<br><br>• නිවැරදි ව චලන ඉදිරිපත් කිරීමට නොහැකියි. භාවිතය අවමයි.<br><br>• චලන හැසිරවීමේ දී සම්ප්‍රදායානුකූල බව නොදනියි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| තාල වාදනයට අනුකූලව නර්තනය ඉදිරිපත් කිරීම | • තාල වාදනයට අනුව නර්තනය ඉදිරිපත් කිරීම විශිෂ්ට දක්ෂතා ප්‍රකට කරයි.<br><br>• වාදනය සහ නර්තනය අතර සහසම්බන්ධතාව ඉතා ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගනියි.<br><br>• සමගුණ හා දෙගුණ තාල ලක්ෂණ හඳුනාගෙන ඉතා විශිෂ්ට ලෙස ඉදිරිපත් කරයි. | • තාල වාදනයට අනුකූල නර්තන කුසලතා ප්‍රදර්ශනය කරයි.<br><br>• වාදනය සහ නර්තනය අතර සහසම්බන්ධතාව හොඳින් පවත්වා ගනියි.<br><br>• සමගුණ හා දෙගුණ තාල ලක්ෂණ ලය හඳුනාගැනීම මනාව ප්‍රදර්ශනය කරයි. | • තාල වාදනයට අනුකූලව නිවැරදි ව නර්තනය කරයි.<br><br>• තාල වාදනයට අනුකූලව නර්තනයේ චලන පැහැදිලි ව ඉදිරිපත් කරයි.<br><br>• සමගුණ, දෙගුණ තාල ලක්ෂණ හඳුනාගෙන පද පෑගීම අවබෝධයෙන් යුතු ව ඉදිරිපත් කරයි. | • තාල වාදනයට අනුව නර්තනය කිරීමට උත්සහ ගනියි.<br><br>• වාදනය සහ නර්තන චලන ඉදිරිපත් කිරීමට උත්සහ ගනියි.<br><br>• සමගුණ, දෙගුණ තාල ලක්ෂණ. හඳුනාගෙන පද පෑගීම සිදු කළ ද ලය පවත්වා ගැනීමට අපහසු යි. | • තාල වාදනයට අනුව නර්තනය ඉදිරිපත් නො කරයි.<br><br>• වාදනය හා නර්තනය අතර සහසම්බන්ධතාව ගොඩනගා ගැනිමට නොහැකි යි.<br><br>• සමගුණ, දෙගුණ ලය පවත්වා ගැනීම ට ඉදිරිපත් තිරීමේ දී අවබෝධයක් නැත. |
| කස්තිරම/ ඉරට්ටිය/ හමාර පදය නර්තනය | • කස්තිරම/ ඉරට්ටිය/ හමාර පදය නර්තනයේ විශිෂ්ට ප්‍රාගුනයක් ප්‍රකට **කරයි.**<br><br>• කස්තිරමේ/ඉරට්ටියේ/ හමාර පදයේ අන්තර්ගත ශාස්ත්‍රීය පද කොටස් අදාළ සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් ඉතා විශිෂ්ට ලෙස ඉදිරිපත් කරයි. | • කස්තිරමේ/ ඉරට්ටියේ/හමාර පදයේ තාල ලක්ෂණ මැනවින් හඳුනාගෙන නර්තනය කරයි.<br><br>• ශාස්ත්‍රීය පද කොටස් මැනවින් ඉදිරිපත් කරයි. අන්තර්ගත පද කොටස් අදාළ සාම්ප්‍රදායික ලක්ෂණ පෙනෙන පරිදි නිවැරදි ව මැනවින් ඉදිරිපත් කරයි.<br><br>• කස්තිරම/ ඉරට්ටිය/ හමාර පදය නිහ්චිතව හඳුනාගෙන මනාව ඉදිරිපත් කරයි. | • සරඹයේ කස්තිරම/ ඉරට්ටිය/ හමාර පදය තාලානුකූලව ඉදිරිපත් කරයි.<br><br>• ශාස්ත්‍රීය පද කොටස් ඉදිරිපත් කළ හැකියි.<br><br>• කස්තිරම/ ඉරට්ටිය/ හමාර පදය/ හඳුනා ගෙන අඛණ්ඩව නර්තනය කරයි. | • සරඹයේ කස්තිරම/ ඉරට්ටිය/ හමාර පදය හඳුනාගනියි.<br><br>• ශාස්ත්‍රීය පද කොටස් ඉදිරිපත් කිරීමට උත්සාහ ගනියි. මතකය අඩුයි.<br><br>• කස්තිරම/ ඉරට්ටිය/ හමාර පදය නර්තනයේ කුසලතා ප්‍රදර්ශනය නොකරයි. | • සරඹයේ කස්තිරම/ ඉරට්ටිය/ හමාර පදය නොහඳුනයි.<br><br>• නිවැරදි පද කොටස් පෑගීම අමතක වේ.<br><br>• ශාස්ත්‍රීය පද ඉදිරිපත් කිරීම දුර්වලයි. |

## ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්
## ක්‍රියාකාරකම 03 :- වන්නම නර්තනය

| නිර්නායකය | විශිෂ්ටයි | ඉතා හොඳයි | හොඳයි | සංවර්ධනය විය යුතුයි | වඩාත් සංවර්ධනය විය යුතුයි |
|---|---|---|---|---|---|
| ගායන කුසලතාව | • නිවැරදි නාදමාලාව, හඬ පාලනය විශිෂ්ට ලෙස පවත්වා ගනිමින් ගායනය කරයි.<br>• වන්නම ගායනයේ දී අදාළ තාල රූපය විශිෂ්ට අන්දමින් පවත්වා ගනියි.<br>• වන්නම (තානම හා කවි) සම්පූර්ණයෙන් විශ්වාසයෙන් යුතු ව මතකයෙන් ගායනා කරමින් කුසලතා දක්වයි. | • නාදමාලාවේ සාම්ප්‍රදායික අනන්‍ය ලක්ෂණ හඳුනාගෙන ගායනා කරයි.<br>• වන්නම ගායනයේ දී අදාළ තාලය නිවැරදි ව පවත්වා ගනියි.<br>• තානම හා කවි නිවැරදි ව මතකයෙන් ගායනා කරයි. | • වන්නමේ කවි නාද මාලාවට අනුකූලව,තාලානුකූලව ගයයි.<br>• තාලයට අනුව ගායනා කුසලතා ඇතත් ඉදිරිපත් කිරීමේ දී හඬ පාලනයේ දුර්වලතා පෙන්නුම් කරයි.<br>• වන්නම මතකයෙන් ගයයි. | • ගායනයේ තාලය හා නාද මාලාව විටින් විට ගිලිහෙයි. ස්ථාවර නොවෙයි.<br>• ගායනය කළ ද කුසලතා අඩුපාඩු සහිතයි.<br>• වන්නමේ වචන මතකයෙන් ගිලිහි ගිය ද ගායනය කරයි. | • නාද මාලාව හා තාලානුකූල බව නොහඳුනයි.<br>• ගායනය කුසලතා පිළිබිඹු නොවෙයි.<br>• ගායනයේ බොහෝ තැන් මතකයෙන් ගිලිහෙයි. |
| පද නර්තනය | • වන්නමට අදාළ පදවල විශිෂ්ට ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි.<br>• නර්තනයේ දී අංග, ප්‍රත්‍යාංග උපාංග නිශ්චිත ව භාවිත කරමින් ප්‍රාසංගිකව ඉදිරිපත් කරයි.<br>• සාම්ප්‍රදායික අනන්‍යතාව ඉතා විශිෂ්ට ලෙස ප්‍රදර්ශනය කරයි.<br>• වන්නම ඉතා ප්‍රශස්ත මට්ටමින් ඉදිරිපත් කරයි. | • වන්නමට අදාළ පද භාවිත කරමින් නිවැරදි ව තාලානුකූල ව නර්තනය කරයි.<br>• වන්නමේ පද මනා ලෙස අංග ප්‍රත්‍යාංග, භාවිත කරමින් නර්තනය කරයි.<br>• සම්ප්‍රදායික අනන්‍යතාව මනාව ප්‍රදර්ශනය කරයි.<br>• වන්නමේ පද නර්තනය අඛණ්ඩව ම නර්තනය කරයි. | • වන්නමේ පද කොටස් තාලානුකූලව නර්තනය කරයි.<br>• වන්නමේ පද නර්තනයේ දී අංගහාරය නිසියාකාරව පවත්වා ගනියි.<br>• සාම්ප්‍රදායික අනන්‍යතාව හඳුනයි.<br>• වන්නමේ පද නර්තනයේ අඛණ්ඩතාව උත්සාහයෙන් යුතු ව පවත්වා ගනියි. | • වන්නමේ පද නර්තනය තාලානුකූලව ඉදිරිපත් කිරීමට උත්සාහ ගනියි.<br>• අංගහාර පවත්වා ගැනීම අඩුපාඩු සහිතයි<br>• සාම්ප්‍රදායික අනන්‍යතාව ගිලිහෙන අවස්ථා පවතී.<br>• වන්නමේ පද නර්තනය අඛණ්ඩ ව සිදු කිරීමට ප්‍රයත්න දරයි. | • ඉදිරිපත් කළ නර්තනය තාල අවබෝධයෙන් තොරයි.<br>• නිවැරදි අංගහාර නොහඳුනයි<br>• සාම්ප්‍රදායික අනන්‍යතාව පිළිබිඹු නොකරයි.<br>• වන්නමේ අදාළ පද නර්තනය නිශ්චිත නැත. |
| කස්තිරම, සීරු මාරුව / කලාසම නර්තනය (උඩරට/ සබරගමු) | • විශිෂ්ට ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි.<br>• නිවැරදි පද පහත්තිය භාවිත කරමින් ශාස්ත්‍රීය පද විශිෂ්ට ලෙස නර්තනය කරයි.<br>• තාලානුකූලව හා නිවැරදි අංගහාර ප්‍රදර්ශනය කරමින් අදාළ පද කොටස් විශිෂ්ට ලෙස ඉදිරිපත් කරයි. | • නර්තනයේ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• පද පහත්තිය නිවැරදි ව භාවිත කරමින් ශාස්ත්‍රීය පද නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර සමඟින් අදාළ පද කොටස් තාලානුකූලව ම අඛණ්ඩ ව හොඳින් ඉදිරිපත් කරයි. | • නර්තනය අවබෝධයෙන් යුතු ව ඉදිරිපත් කරයි.<br>• පද පහත්තිය රැක ගැනීමට උත්සහ දරමින් ශාස්ත්‍රීය පද නර්තනය කරයි.<br>• නිවැරදි අංගහාර සමඟින් අදාළ පද කොටස් තාලානුකූලව මතකයෙන් නර්තනය කරයි. | • නර්තනයේ පද හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• පද පහත්තිය පිළිබඳ බොහෝවිට අවධානය ගිලිහෙයි.<br>• අදාළ පද කොටස් මතකයෙන් ගිලිහී ගිය ද අංගහාර අඩුපාඩු සහිත ව තාලානුකූලව ඉදිරිපත් කිරීමට උත්සාහ දරයි. | • නර්තන කුසලතා දුර්වලයි.<br>• පද පහත්තිය පිළිබඳ නොසලකා නර්තනය කරයි.<br>• අදාළ පද කොටස් මතකයෙන් ගිලිහෙන අතර අංගහාර හා තාලාවබෝධය පිළිබඳ ව අවබෝධයෙන් තොරව නර්තනය කරයි. |
| ඉරට්ටිය තාල තබමින් කීම (පහතරට) | • ඉරට්ටියෙහි ශාස්ත්‍රීය පද කොටස් මනාව උච්චාරණය කරමින් තාල තැබීම විශිෂ්ට ලෙස ඉදිරිපත් කරයි. | • ඉරට්ටියෙහි ශාස්ත්‍රීය පද කොටස්, ගති ලක්ෂණ හෙළිවන ආකාරයට උච්චාරණය කරමින් තාල තබයි. | • ඉරට්ටියෙහි පද කොටස් නිවැරදි ව තාල තබා කියයි. | • ඉරට්ටියෙහි ශාස්ත්‍රීය පද කොටස් උච්චාරණය හා තාල තැබීම අතර සහසම්බන්ධතාව රැක ගැනීමට උත්සහ දරයි. | • ඉරට්ටියෙහි ශාස්ත්‍රීය පද කොටස් මතකයෙන් ගිලිහෙයි. උච්චාරණය හා තාල තැබීම සහසම්බන්ධතාවෙන් තොරයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| අඩව්ව/ඉරට්ටිය ඉදිරිපත් කිරීම | • සම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය කරමින් අඩව්ව/ ඉරට්ටිය ඉතා ප්‍රශස්ත මට්ටමින් නර්තනය කරයි.<br>• නිවැරදි පද කොටස් ඉතා විශිෂ්ට අංගහාර පවත්වා ගනිමින් නර්තනය කරයි.<br>• අඩව්වේ/ ඉරට්ටියේ සුවිශේෂි පද පෑගීම ඉතා විශ්වාසයකින් යුතු ව පැහැදිලි ව ඉදිරිපත් කරයි. | • සම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය කරමින් අඩව්ව/ ඉරට්ටිය ඉතා හොඳින් නර්තනය කරයි.<br>• නර්තනය කරනු ලබන පද කොටස් සහ එහි අංගහාරවල ගති ලක්ෂණ උසස් මට්ටමක පවත්වා ගනියි.<br>• සුවිශේෂ පද පෑගීම අඛණ්ඩ ව, පැහැදිලි ව ඉදිරිපත් කරයි. | • සම්ප්‍රදායික අනන්‍යතා තිබුණ ද අඩුපාඩු සහිතව අඩව්ව/ ඉරට්ටිය නර්තනය කරයි.<br>• අඩව්ව / ඉරට්ටියට ගැලපෙන අංගහාර පවත්වා ගැනීමට උත්සහ දරමින් නර්තනය ඉදිරිපත් කරයි.<br>• සුවිශේෂි පද පෑගීම පැහැදිලියි. | • සම්ප්‍රදායික අනන්‍යතා ප්‍රදර්ශනය නො කරමින් අඩව්ව/ ඉරට්ටිය නර්තනය කරයි.<br>• අඩව්ව/ ඉරට්ටිය නර්තනයේ දී පුහුණුවකින් තොරව කඩින් කඩ නර්තනය කරයි.<br>• පද පෑගීමේ දී අඩුපාඩු සහිතයි. | • සම්ප්‍රදායික අනන්‍යතා නොහඳුනයි. කුමන හෝ පද කොටසක් නර්තනය කිරීමට උත්සහ දරයි.<br>• අඩව්ව/ ඉරට්ටිය නර්තනයට නොහැකියාව ප්‍රදර්ශනය වෙයි. |

# ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්

## ක්‍රියාකාරකම 04 :-ගැමි නැටුම් නිර්මාණය (කේවල)

| නිර්නායකය | විශිෂ්ටයි | ඉතා හොඳයි | හොඳයි | සංවර්ධනය විය යුතුයි | වඩාත් සංවර්ධනය විය යුතුයි |
|---|---|---|---|---|---|
| උචිත චලන භාවිතය | • විශිෂ්ට ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි. තෝරා ගත් ගැමි නැටුමට උචිත චලන මනාව නිර්මාණය කරයි.<br><br>• ගැමි නැටුමේ අවස්ථාව මැනවින් පිළිඹිබු වන චලන නිර්මාණය කරයි.<br><br>• භාවිත ගැමි චලන ප්‍රකාශනාත්මක ගුණයෙන් ඉතා පොහොසත් ය. | • ගැමි නැටුමට උචිත චලන නිර්මාණය කරයි.<br><br>• ගැමි චලන මගින් අවස්ථාව හා ක්‍රියාකාරකම මැනවින් පිළිඹිබු කරයි.<br><br>• භාවිත ගැමි චලන ප්‍රකාශන ගුණයෙන් යුක්තයි. | • යොදා ගන්නා චලන ගැමි නැටුම සඳහා ගැලපේ.<br><br>• ගැමි නැටුමට අදාළ චලනවලින් අවස්ථා තරමක් දුරට පිළිඹිබු කරයි.<br><br>• භාවිත ගැමි චලනවල ප්‍රකාශනය ස්ථාවර නැත. | • තාලයට හෝ රිද්මයට අනුව කුමන හෝ චලනයක් සිදු කරයි.<br><br>• චලන භාවිත කළ ද ඒවා අවස්ථාවට උචිත නොවේ.<br><br>• භාවිත ගැමි චලනවල ප්‍රකාශනයක් සිදු නොවෙයි. | • චලන භාවිත කළ ද, ඉදිරිපත් කරන චලන උචිත නොවෙයි.<br><br>• යොදා ගන්නා චලන ගැමි නැටුමට මෙන් ම අවස්ථාව ඉදිරිපත් කිරීමට උචිත නොවෙයි. |
| රංග උපකරණ හැසිරවීම | • නර්තනයට අදාළ ව යොදා ගන්නා රංග උපකරණ භාවිතයේ දී අපූර්වත්වයක් මෙන් ම භාවිතය පිළිබඳ ව විශිෂ්ට ප්‍රාගුණ්‍යයක් ප්‍රකට කරයි.<br><br>• රංග උපකරණ භාවිතය අවස්ථානුකූලව නර්තනය සමග නිර්මාණය කර ගනිමින් එහි සහසම්බන්ධතාව ඉතා විශිෂ්ට ලෙස ප්‍රදර්ශනය කරයි.<br><br>• චලනවල ගති ලක්ෂණ තීව්‍ර වන ආකාරයට රංග උපකරණ මනා ලෙස හසුරවයි. | • රංග උපකරණ භාවිතය අතර සහසම්බන්ධතාව මනා විශ්වාසයකින් යුතු ව ඉදිරිපත් කරයි.<br><br>• රංග උපකරණ භාවිත අවස්ථා පැහැදිලි ව ගැමි චලනවලට අනුව නිර්මාණාත්මකව භාවිතා කරයි. | • රංග උපකරණ අවබෝධයෙන් යුතුව භාවිත කරමින් නර්තනය කරයි.<br><br>• රංග උපකරණ භාවිතයේ දී ගැමි නැටුමට අදාළ චලන සමග ගලපමින් ඉදිරිපත් කරයි. | • රංග උපකරණ භාවිත කළ ද යොදා ගන්නා අවස්ථාව පිළිබඳ ව අවබෝධය ප්‍රමාණවත් නොවෙයි.<br><br>• රංග උපකරණ භාවිතයේ දී ගැමි නැටුමට අදාළ චලන ඉදිරිපත් කිරීමට උත්සහ ගනියි. | • භාවිත කරන රංග උපකරණ නර්තනය සමග අනවබෝධයෙන් භාවිත කරයි.<br><br>• රංග උපකරණය භාවිතයේ දී ගැමි නැටුමට අදාළ චලන ගොඩ නගා ගැනීමට අපහසුයි. |
| අවකාශ භාවිතය | • ලැබී ඇති අවකාශය මනා ලෙස භාවිතය කරමින් නර්තනයේ යෙදේ.<br><br>• ඉහළ, පහළ හා මැද තල භාවිතය ඉතා විශිෂ්ටයි.<br><br>• ගැමි නැටුම් නිර්මාණය ආරම්භයේ සිට අවසානය දක්වා රංග වින්‍යාසය ගොඩනැගීම විශිෂ්ටයි. | • ලැබී ඇති අවකාශය හොඳින් භාවිත කරමින් නර්තනය කරයි.<br><br>• ඉහළ, පහළ හා මැද තල භාවිත කිරීම අවබෝධයෙන් යුතු ව සිදු කරයි.<br><br>• නිර්මාණය ආරම්භයේ සිට අවසානය දක්වා පෙළ ගස්වයි. | • අවකාශය භාවිත කරයි.<br><br>• තල භාවිතයේ අවබෝධයක් ඇත.<br><br>• නර්තනය පෙළ ගැස්ම පිළිබඳ තරමක අවබෝධයක් ඇත. රංග වින්‍යාසය අවබෝධය අඩුයි. | • අවකාශයේ ඇතැම් කොටස් භාවිත නොකරයි.<br><br>• අවම තල භාවිතය දක්නට ලැබේ.<br><br>• නර්තන පෙළ ගැස්ම සාර්ථකව ප්‍රදර්ශනය නොකරයි. | • අවකාශ භාවිතය ඉතා ම සීමිතයි<br><br>• තල භාවිතය පිළිබඳ සැලකිල්ලක් නොදක්වයි.<br><br>• රංග වින්‍යාසය පෙළ ගැස්මක් නොහඳුනයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ඉදිරිපත් කිරීම | • ගැමි ගායනයට හානි නොවන සේ විශිෂ්ට චලන ඉදිරිපත් කරයි.<br><br>• ආරම්භයේ සිට අවසානය දක්වා ප්‍රාසංගික බව ඉතා විශිෂ්ට මට්ටමක පවත්වා ගනිමින් සබකෝලයෙන් තොරව රස විඳිමින් නර්තනය ඉදිරිපත් කරයි | • ගැමි ගායනයට හානි නොවන සේ ඉතා හොඳ මට්ටමකින් චලන ඉදිරිපත් කරයි.<br><br>• ආරම්භයේ සිට අවසානය දක්වා ප්‍රාසංගික බව හොඳින් පවත්වා ගනමින් ඉතා කැමැත්තෙන් නර්තනය කිරීමට අවස්ථාව ලබා ගනී. | • ගැමි ගායනය සමගින් නර්තනය ඉදිරිපත් කරයි.<br><br>• ආරම්භයේ සිට අවසානය දක්වා ප්‍රාසාංගික බව හා නර්තන නිමාව තරමක් දුරට පවත්වා ගනිමින් ගැමි නිර්මාණයට කැමැත්තෙන් ඉදිරිපත් වෙයි. | • ගායනය හා නර්තනය අතර සබඳතාව බණ්ඩනය වන අවස්ථා ද පවතියි.<br><br>• ඉදිරිපත් කිරීමේ දී ආරම්භයේ සිට අවසානය දක්වා ප්‍රාසාංගික බව පවත්වා ගැනීම ප්‍රමාණවත් නොවෙයි. | • ගායනය කිරීමට මැලි කමක් දක්වයි ගායනා මතක නැත.<br><br>• සබ කෝලයෙන් යුක්තයි. නර්තනය ඉදිරිපත් කිරීමට උදාසීන බවක් දක්වයි. |

## ලකුණු ප්‍රදානය සඳහා අපේක්ෂිත සාධන මට්ටම්
## ක්‍රියාකාරකම 05 :- නර්තන නිර්මාණ (නර්තන මාධ්‍යයෙන් චරිත හා සිද්ධි නිරූපණය)

| නිර්නායකය | විශිෂ්ටයි | ඉතා හොඳයි | හොඳයි | සංවර්ධනය විය යුතුයි | වඩාත් සංවර්ධනය විය යුතුයි |
|---|---|---|---|---|---|
| චරිත ස්වභාවය හඳුනා ගැනීම හා භාව ප්‍රකාශනය | • සාත්වික අභිනය විශිෂ්ට අන්දමින් භාවිත කරයි.<br><br>• එක් එක් අවස්ථාවට ගැලපෙන විවිධ භාවයන්ගේ වෙනස්වීම ඉතා මැනවින් අවබෝධ කරගෙන ඉතා විශිෂ්ට ලෙස නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරයි.<br><br>• අවස්ථාවට හා සිද්ධියට අනුකූලව සියුම් අරුත් ඉස්මතු වන සේ ඉතා විශිෂ්ට ලෙස භාවයන් ප්‍රදර්ශනය කරයි. | • සාත්වික අභිනය මනාව ප්‍රදර්ශනය කරයි.<br><br>• එක් එක් අවස්ථාවට අනුකූල, භාව ප්‍රකාශනය අවබොධයෙන් යුතු ව සාර්ථක ව ඉදිරිපත් කරයි.<br><br>• චරිතයේ ස්වභාවයට, අවස්ථාවට හා විවිධත්වයට ගැලපෙන පරිදි භාවයන් සැලසුම් සහගතව ඉතා හොඳින් ඉදිරිපත් කරයි. | • අවස්ථාවට හා චරිතයට ගැලපෙන පරිදි භාවයන් ඉදිරිපත් කරයි.<br><br>• චරිතයේ අදාළ භාවයන් සාත්වික අභිනයෙන් ඉදිරිපත් කිරීමේ දී එය ගිලිහෙන අවස්ථා පවතී.<br><br>• අවස්ථාවට හා සිද්ධියට ගැලපෙන චරිතයේ ස්වභාවයන් හඳුනාගෙන භාවාත්මක ව ඉදිරිපත් කිරීමට උත්සහ ගනියි. | • සාත්වික අභිනය සුළු වශයෙන් දක්නට ලැබේ.<br><br>• ඉදිරිපත් කරන චරිතය පිළිබඳ ව අවබෝධයෙන් තොරව ඉදිරිපත් කරයි.<br><br>• ඉදිරිපත් කිරීමේ දී භාව ප්‍රකාශන ගිලිහෙයි. | • අභිනය පිළබඳ අවබෝධයක් නැත.<br><br>• චරිතය ඉදිරිපත් කළ ද විශ්වාසයක් තොරව කුමක් හෝ කර පෙන්වීමට උත්සාහ දරයි.<br><br>• භාව ප්‍රකාශනයක් නැත. |
| අවස්ථා, සිද්ධි ගොඩනැගීම | • විශිෂ්ට මට්ටමේ නිර්මාණශීලී පරිකල්පනයකින්, නර්තන මාධ්‍යයෙන් අවස්ථා/සිද්ධි ගොඩ නගාගෙන ඉදිරිපත් කරයි. | • ආරම්භයේ පටන් අවසානය දක්වා නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කළ හැකි අවස්ථා/සිද්ධි ගොඩනගයි. | • ආරම්භයේ සිට අවසානය දක්වා සිද්ධි දාමයක් ගොඩනගා ඉදිරිපත් කිරීමට උත්සහ කරයි. | • සිද්ධි/ අවස්ථා ඉදිරිපත් කළ ද අඛණ්ඩව අවස්ථා ප්‍රදර්ශනය නොකරයි. | • ආරම්භය අවසානය පිළිබඳ අවබෝධයක් නැත.<br>• එක් ක්‍රියාවක් හෝ කිහිපයක් කිරීමට උත්සහ කරයි. |
| උචිත නර්තන චලන භාවිතය | • අවස්ථාව ඉස්මතු කිරිමට උචිත තාලානුකූල හා රිද්මයානුකූල නර්තන චලන මනා අවබෝධයෙන් යුතු ව විශිෂ්ට ලෙස භාවිත කරයි.<br><br>• ඉදිරිපත් කිරීම සඳහා නිර්මාණාත්මක බෙරපද භාවිතය කෙරෙහි දක්වන සැලකිල්ල විශිෂ්ටයි.<br><br>•විශිෂ්ට ප්‍රාගුණ්‍යයක් ප්‍රදර්ශනය කරයි.<br>• චලන අතිශයින් ම නිර්මාණත්මක ය. | • තාලානුකූල හා රිද්මානුකූල චලන, අවස්ථා හා සිද්ධි හොඳින් භාවිත කරයි.<br><br>• චලනය සිද්ධියට අනුකූල ආකාරයෙන් ඉදිරිපත් කිරීමට දැනුම්වත් ය. නිර්මාණයට නර්තන බෙරපද යොදා ගනියි.<br><br>• ඉදිරිපත් කිරීමේ දී බෙරපද යොදා ගැනිම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | • අවස්ථා හා සිද්ධි ඉදිරිපත් කිරිමට තාලානුකූල හා රිද්මානුකූල චලන භාවිත කරයි.<br><br>• බෙර වාදනයට අනුගතව චරිතයට අදාළ චලන ඉදිරිපත් කරයි.<br><br>• නිර්මාණාත්මක නර්තන චලන භාවිතය අඩුයි. | • අවස්ථා සිද්ධි ඉදිරිපත් කිරිමේදී තාලානුකූල හා රිද්මානුකූල චලන අපැහැදිලිය. උත්සාහ ගත්තද එය බණ්ඩනය වන අවස්ථා බහුලය.<br><br>• අදාළ චලන බෙර වාදනයට අනුකූලව සිදු කිරීමට උත්සහ ගනියි.නර්තන චලන අසාර්ථකයි.<br><br>• ඉදිරිපත් කිරීමේ දී චරිත ලක්ෂණ ඉස්මතුවීම ප්‍රමාණවත් නොවෙයි. | • සිද්ධි ඉදිරිපත් කිරිමේ දී තාලානුකූල හා රිද්මානුකූල චලන භාවිතය පිළිබඳ අවබෝධය නැත.<br><br>• බෙර වාදනය පිළිබඳ සැලකිල්ලක් නොදක්වයි. රිද්ම, තාල නොහඳුනයි.<br><br>• ඉදිරිපත් කිරීම දුර්වලයි. |
| අවකාශ භාවිතය හා ඉදිරිපත් කිරීම | • අවකාශය අර්ථවත් ව යෝග්‍ය පරිදි භාවිත කරමින් ප්‍රබල නිර්මාණයක් ගොඩනගයි.<br><br>• ඉදිරිපත් කිරීමේ දී රංගනය සඳහා ඇති භූමිය ද තල හා දිශා භාවිතය ද අර්ථවත් ව විශිෂ්ට ලෙස යොදා ගනිමින් නිර්මාණය ඉදිරිපත් කරයි. | • ඉදිරිපත් කිරීමේ දී අවකාශ මෙන් ම තල හා දිශා භාවිතය ද රංගනය සඳහා ඇති භූමිය ද අර්ථවත් ව යොදා ගනිමින් නිර්මාණ ඉදිරිපත් කරයි. | • දිශා හා තල භාවිතයේ දී රංගනය සඳහා ඇති භූමිය පිළබඳව ද දැනුවත් ව කටයුතු කරයි.<br>අවකාශය භාවිත කරමින් චරිත හා සිද්ධි ඉදරිපත් කරයි. | • ගණ හා තල භාවිතය මෙන් ම රංගනය සඳහා ඇති භූමිය පිළිබඳ අවබෝධය පැවතිය ද ඉදිරිපත් කිරීමේ දී පැහැදිලි නැත. | • අවකාශ භාවිතය ඉතා ම සීමිතයි.<br><br>• මැද තලය පමණක් භාවිතා කරයි. නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් නැත. |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020
පාසල් පාදක තක්සේරුකරණය යටතේ - (44) නර්තනය (දේශීය) විෂයට අදාළ 11 ශ්‍රේණියේ අවසාන තක්සේරුකරණය
විස්තරාත්මක ලකුණු සටහන් පත්‍රිකාව

විභාග අංකය :- .......................................... දිනය :- .......................................... මණ්ඩල අංකය :- ..........................................

| ප්‍රදානය කරන ලකුණ (ක්‍රියාකාරකම 01 සිට ක්‍රියාකාරකම 05 දක්වා)<br>එක් එක් ක්‍රියාකාරකමට අයත් නිර්ණායක සඳහා අපේක්ෂකයාට පිරිනැමෙන ලකුණු වටා කවයක් අඳින්න | | | | | |
|---|---|---|---|---|---|
| විශිෂ්ටයි - 5 / ඉතා හොඳයි - 4 / හොඳයි - 3 / සංවර්ධනය විය යුතුයි - 2 / වඩාත් සංවර්ධනය විය යුතුයි - 1 | 5 | 4 | 3 | 2 | 1 |

ඉදිරිපත් කළ කැමති ගායනය :- ..........................................

නම් කරන ලද ගායනය (තෝරා ගත්) :- ..........................................

වාදනය කළ බෙර සරඹය :- ..........................................

වාදනය කළ බෙර පදය:- ..........................................

| | | | | | | | | | | ලකුණු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම 01 | ගායන | අ | I | කැමති ගායනයේ කුසලතා ප්‍රදර්ශනය | 5 | 4 | 3 | 2 | 1 | |
| | | | II | නම් කරන ලද ගායනයේ කුසලතා ප්‍රදර්ශනය | 5 | 4 | 3 | 2 | 1 | |
| | වාදන | ආ | I | බෙර සරඹ වාදන කුසලතාව | 5 | 4 | 3 | 2 | 1 | |
| | | | II | බෙර පද වාදන කුසලතාව | 5 | 4 | 3 | 2 | 1 | |

නර්තනය කළ ගොඩ සරඹය :- ..........................................

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම 02 සරඹ නර්තනය | නිවැරදි අංගහාර හා සාම්ප්‍රදායික ලක්ෂණ භාවිතය | 5 | 4 | 3 | 2 | 1 | |
| | ශරීර චලන හැසිරවීම | 5 | 4 | 3 | 2 | 1 | |
| | තාල වාදනයට අනුකූලව නර්තනය | 5 | 4 | 3 | 2 | 1 | |
| | කස්තිරම/ ඉරට්ටිය/හමාර පදය නර්තනය | 5 | 4 | 3 | 2 | 1 | |

නර්තනය කළ වන්නම :- ..........................................

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම 03 වන්නම නර්තනය | ගායන කුසලතාව | 5 | 4 | 3 | 2 | 1 | |
| | පද නර්තනය | 5 | 4 | 3 | 2 | 1 | |
| | කස්තිරම, සීරුමාරුව/ කලාසම නර්තනය/ ඉරට්ටිය තාල තබමින් කීම | 5 | 4 | 3 | 2 | 1 | |
| | අඩව්ව/ඉරට්ටිය නර්තනය | 5 | 4 | 3 | 2 | 1 | |

නර්තනය කළ ගැමි නැටුම :- ..........................................

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම 04 ගැමි නර්තනය | උචිත චලන භාවිතය | 5 | 4 | 3 | 2 | 1 | |
| | රංග උපකරණ හැසිරවීම | 5 | 4 | 3 | 2 | 1 | |
| | අවකාශ භාවිතය | 5 | 4 | 3 | 2 | 1 | |
| | ඉදිරිපත් කිරීම | 5 | 4 | 3 | 2 | 1 | |

නිර්මාණය කළ චරිතය :- ..........................................

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක්‍රියාකාරකම 05 නර්තන නිර්මාණ | චරිත ස්වභාවය හඳුනා ගැනීම හා භාව ප්‍රකාශනය | 5 | 4 | 3 | 2 | 1 | |
| | අවස්ථා, සිද්ධි ගොඩ නැඟීම | 5 | 4 | 3 | 2 | 1 | |
| | උචිත චලන භාවිතය | 5 | 4 | 3 | 2 | 1 | |
| | අවකාශ භාවිතය හා ඉදිරිපත් කිරීම | 5 | 4 | 3 | 2 | 1 | |

නිගමනය කළ අවසාන ලකුණු 100න්

අවසාන ලකුණ නිවැරදි ය. එකතුව පරීක්ෂා කළෙමු.

පරීක්ෂක 1 - නම :- ................................ සංකේත අංකය ................................ අත්සන................

පරීක්ෂක 2 - නම :- ................................ සංකේත අංකය ................................ අත්සන................

ප්‍රධාන පරීක්ෂකගේ - නම :- ................................ සංකේත අංකය ................................ අත්සන................

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2020
පාසල් පාදක තක්සේරුකරණය යටතේ (44) නර්තනය (දේශිය) විෂයට අදාළ 11 ශ්‍රේණියේ
අවසාන තක්සේරුකරණය
සංක්ෂිප්ත ලකුණු සටහන් පත්‍රිකාව

විභාග අංකය :- .........................................

මණ්ඩල අංකය :.......................................

පරීක්ෂණ දිනය:.........................................

| අනු අංකය | විභාග අංකය | මුළු ලකුණු (100) | ක්‍රියාකාරකම 01 ලකුණු 20 | ක්‍රියාකාරකම 02 ලකුණු 20 | ක්‍රියාකාරකම 03 ලකුණු 20 | ක්‍රියාකාරකම 04 ලකුණු 20 | ක්‍රියාකාරකම 05 ලකුණු 20 |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |
| 5 | | | | | | | |
| 6 | | | | | | | |
| 7 | | | | | | | |
| 8 | | | | | | | |
| 9 | | | | | | | |
| 10 | | | | | | | |
| 11 | | | | | | | |
| 12 | | | | | | | |
| 13 | | | | | | | |
| 14 | | | | | | | |
| 15 | | | | | | | |
| 16 | | | | | | | |
| 17 | | | | | | | |
| 18 | | | | | | | |
| 19 | | | | | | | |
| 20 | | | | | | | |

1 පරීක්ෂක නම................................................ අත්සන...........................................

සංකේත අංකය ..........................................................

2 පරීක්ෂක නම................................................ අත්සන...........................................

සංකේත අංකය ..........................................................

ප්‍රධාන පරීක්ෂකගේ නම................................................ අත්සන...........................................

සංකේත අංකය ..........................................................